# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය සංස්ථාගත
කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කනක හේරත් මහතා විසින්
2011 මාර්තු මස 09 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2011 පෙබරවාරි මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[96 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය**
**(සංස්ථාගත කිරීමේ)**

**මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය**
**සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන පහත සඳහන් සංගමයක්, ඒ සංගමයේ සාමාජිකාවන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා හා පරමාර්ථ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ඇති හෙයින් ද එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2011 අංක දරන මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය සංස්ථාගත කිරීම.

**2.** මෙහි මින් මතු "මහා සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලබන තැනැත්තන්, මේ සංගමය ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සහ ඉන් පසුව "මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත්වන්නේ ය. තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ය:—

(අ) මොනරාගල දිස්ත්‍රික්කය තුළ කාන්තා සංවිධාන සංසදයක් ලෙස ක්‍රියාත්මක වීම;

2—PL 005514—750 (2011/02)

(ආ) කාන්තාවන් හා ළමුන් පිළිබඳව තොරතුරු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම;

(ඇ) කාන්තාවන් මුහුණ දෙන සියලු විපත්වලදී සහ සැමියා අහිමිවීම මත මුහුණ දෙන අසරණවීම් වලදී සහාය වීම හා මැදිහත් වීම;

(ඈ) කාන්තා කාර්යයන් සඳහා අරමුදල් භාරයක් පිහිටුවීම;

(ඉ) කාන්තාව දේශපාලනිකව සවිඥානය කිරීම සහ ප්‍රාදේශීය සම්පත් කළමනාකරණයේදී නියෝජිතයන් බවට පත් කිරීම;

(ඊ) කාන්තාව කුඩා කණ්ඩායම් ක්‍රියාවලිය තුළ ඉතිරි කිරීමේ සහ ණය ගනු දෙනු සංස්කෘතියට සක්‍රීයව දායක කරලීම;

(උ) උදව් අවශ්‍ය කරන්නා වූ අඩු ආදායම් ලබන කාන්තාවන් සඳහා අවශ්‍ය ස්වයං රැකියා ආධාර, ණය, උපකරණ, ඇඳුම් පැළඳුම් සහ වෙනත් මූල්‍යාධාර සැපයීම;

(ඌ) දිළිඳු කාන්තාවන්ට අවශ්‍ය අවස්ථාවන්හි නීති ආධාර සහ නීති උපදෙස් ලබා ගැනීම සඳහා සහායවීම;

(එ) මානසික සහ ශාරීරික දුබලතාවලින් පීඩා විඳින කාන්තාවන් සහ වැඩිහිටි කාන්තාවන්ට ආධාර ලබා දීම සහ සුහසාධන පහසුකම් සැලැස්වීම;

(ඒ) පොත්පත්, සඟරා, පත්‍රිකා, පුවත් පත් සහ වාර සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ බෙදාහැරීම හා පුස්තකාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම;

(ඔ) සංස්ථාවේ අරමුණු ප්‍රවර්ධනය සහ ඉටු කරගැනීම සඳහා අවශ්‍යයයැයි සංස්ථාව සලකන ප්‍රදර්ශන, සාකච්ඡා, පුහුණු වැඩමුළු, විවාද, සංචාර, පැවැත්වීම, සංවිධානය කිරීම සහ පවත්වාගෙන යාම;

(ඕ) කාන්තාවන්ගේ විවාහ මංගල්‍ය, අවමංගල්‍ය උත්සව සඳහා අවශ්‍ය උපකරණ හා සුහසාධන පහසුකම් සැලැස්වීම;

(ක) කාන්තාවන් මුහුණ දෙන විවිධ පීඩාවලදී සහන සැලැස්වීම සඳහා දේශීය හෝ විදේශීය රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඛ) කාන්තාවන්ගේ සිංහල, ඉංග්‍රීසි, දෙමළ භාෂා දැනුම, පරිගණක දැනුම සහ වෘත්තීය දැනුම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් පවත්වාගෙන යාම ; සහ

(ග) සංස්ථාවේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් හෝ මුදුන්පත් කරගැනීම අවශ්‍ය වන හෝ හිතකරවන හෝ ආනුෂංගික වන වෙනත් කවර හෝ කර්තව්‍යයක් සහ වෙනත් දේ ඉටු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලතල ද ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක්, වැඩිදියුණු කිරීම උදෙසා අවශ්‍ය හෝ යෝග්‍ය කවර හෝ සියලු ක්‍රියා, කාරණා හෝ දේවල් කිරීමට, ඉටු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නා වූ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම, හුවමාරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් නීයාදනය කිරීම බැඳීමකට යටත් කිරීම හෝ බැහැර කිරීම;

(ආ) සංස්ථාවේ කාර්යයන් මුදුන්පමුණුවා ගැනීම සඳහා හෝ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන සියලු ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට කෙලින්ම හෝ සංස්ථාව විසින් බලය පවරනු ලැබූ සංස්ථාවේ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් ඇතුළත් වීම, ඒවා ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම;

(ඇ) මුදලින් හෝ වෙනත් ආකාරයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ඉල්ලා සිටීමට, ලබා ගැනීමට සහ එක් රැස් කිරීමට;

(ඈ) සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ යම් බැංකුවක ජංගම තැන්පතු සහ ඉතිරි කිරීමේ ගිණුම් පවත්වාගෙන යාම;

(ඉ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍යවන මුදල් සුදුසු යැයි සංස්ථාව විසින් සඳහන් කරනු ලබන ආකාරයට සහ එසේ සුදුසු යැයි සලකනු ලබන ඇප මත ණයට ගැනීම හෝ ආයෝජනය කිරීම;

(ඊ) පොත්, වාර ප්‍රකාශන, සඟරා සහ වෙනත් ලිපි ලේඛන පළ කිරීම හෝ පළ කිරීමට කටයුතු යෙදීම සහ පුස්තකාල, පොත් සාප්පු සහ මුද්‍රණාල පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම, ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නියම කිරීම සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සහ ආනුෂංගික හෝ හිතකර වන වෙනත් සියලු ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු විධායක සභාපති, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික, පාලක ලේකම් සංවිධායකවරු එකොළොස් දෙනෙකු, ප්‍රාදේශීය සංගම්වල පාලක ලේකම්වරු එකොළොස් දෙනෙකු ඇතුළු සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට අනුකූලව තෝරාපත්කර ගනු ලබන විසිහත් දෙනකුට නොවැඩි සාමාජික සංඛ්‍යාවකගෙන් සමන්විත වූ විධායක සභාවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) මහා සංගමයේ ආරම්භක සාමාජිකයා වූ ගරු අමාත්‍ය සුමේධා ජී. ජයසේන මහත්මිය විධායක සභාවේ ප්‍රථම විධායක සභාපතිවරයා විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති මහා සංගමයේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන විධායක මණ්ඩලය සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතරයකින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය:—

(අ) විධායක සභාවේ සාමාජිකයින් තෝරා පත්කර ගැනීම, පත්කිරීම හෝ නම් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ ඔවුන්ගේ ධුර කාලය;

(ආ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන සහ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර සහ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම;

(ඈ) සංස්ථාවේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඉ) සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය භාරකාරත්වය සහ එහි අරමුදල් ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය ; සහ

(ඊ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ සපුරාලීම.

(2) (1) වැනි උප වගන්තිය යටතේ සාදනු ලබන කවර හෝ රීතියක් එවැනි ම රැස්වීමක දී සහ එවැනි ම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මක වූ මහා සංගමයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවනතාක් දුරට මේ වගන්තිය යටතේ සෑදූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුත්තා හ.

සංස්ථාවේ මුද්‍රාව.

**7.** සභාපතිවරයා ද, පාලක ලේකම්වරයා හෝ භාණ්ඩාගාරික යන දෙදෙනාගෙන් එක් අයකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අය විය යුතු ණය.

**8.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමයේ සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට මහා සංගමයට අය විය යුතු සියලු ණය හා මහා සංගමය වෙත ගෙවිය යුතු සියලු සම්මාදම් මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගන්නා ලද මින් මතු භාරගනු ලබන ත්‍යාග, රික්තවරණ පරිත්‍යාග, ග්‍රාහක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන සංගමය විසින් නිශ්චය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

විගණනය හා ගිණුම්.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ “සුදුසුකම්ලත් විගණකවරයකු” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ.**

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුවම, සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන නිශ්චය කරනු ලැබිය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

**12.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.